**ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 සහ 2 ඡේදවල මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---

(අ) මන්තායි නැගෙනහිර

(ආ) මරිටයිම්පත්තු

(ඇ) ඔඩ්ඩුසුඩාන්

(ඈ) පුදුකුඩියිරුප්පු

(ඉ) තුනුක්කායි

(ඊ) වැලිඔය

**1.1 විගණන විෂය පථය**

---

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 සැප්තැම්බර් 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම්**

---

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 214.77 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 206.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 8.47ක් හෙවත් සියයට 3.94 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 144.72 | 136.52 | 8.20 | 5.67 |
| මූලධන | 70.05 | 69.78 | 0.27 | 0.38 |
| එකතුව | **214.77** | **206.30** | **8.47** | 3.94 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

---------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 15 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් එකතුව රු.මිලියන 961.17 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු. මිලියන 777.22 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව, ඉතිරිය ලබා දී තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 183.95 ක් හෙවත් සියයට 19.14 ක් වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

--------------------

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

--------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 26701 | 12.00 | 11.99 | 6.00 | 9.36 | 50.00 | 35.06 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

-------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 6003/0000/00/0043/0000/000 දරන තැන්පත් ගිණුමෙ, 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 36,863,113 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.13 දක්වා වූ ඡේදවල දක්වා ඇත.

## 3. ශීර්ෂ 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය

### 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 මාර්තු 31 දිනට ඉදිරිපත් කළ යුතු ආදායම් ගිණුම 2015 ඔක්තෝබර් 14 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| උපපත්‍රිකා පොත් ලේඛණය | කච්චේරි මාර්ගෝපදේශක අත්පොත 5:10 | පවත්වා නොතිබුණි |
| පොත් නාමාවලිය | කච්චේරි මාර්ගෝපදේශක අත්පොත 5:9 | පවත්වා නොතිබුණි |
| දුරකථන ලේඛණය | මුදල් රෙගුලාසි 846(3), 845(1) | යාවත්කාලීන කර නොතිබුණි |

| | | |
|---|---|---|
| පරිපූරක ලේඛණය | මුදල් රෙගුලාසිය 533 | යාවත්කාලීන කර නොතිබුණි |
| අග්‍රිම ලේඛණය | මුදල් රෙගුලාසිය 371 | යාවත්කාලීන කර නොතිබුණි |
| ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |

## 3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක එකතුව රු.7,842,114 ක් වූ ගනුදෙනු 177 ක් ලදුපත්, ඉන්වොයිස්පත්, බිල්පත්, පැමිණීමේ ලේඛණ, දිනපොත් උපුටන, අගය එකතු කිරීමේ බදු සහතික, අනුමත කිරීමේ ලිපි සහ නිම කළ වැඩ වාර්තා යනාදි සාක්ෂි නොවීම මත සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 3.4 විසර්ජන ගිණුම්

### අයවැය විචලනය

පුනරාවර්තන වැය විෂයයන් 07ක සියයට 5.4 සිට සියයට 86.3 ක් දක්වා වූ ඉතිරි වීම් රු.7,828,154 ක් සඳහා සැහීමට පත්විය හැකි හේතු ඉදිරිපත් නොවීය .

## 3.5 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 36,863,113ක් වූ තැන්පත් ගිණුම් ශේෂයේ වයස් විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06කට අදාලව එකතුව රු.8,645,728ක් වූ තැන්පතු ශේෂවල විස්තර විගණනය වෙත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රු.2,586,065ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් ඒවා තැන්පත් කිරීමේ හේතු විගණනයේදි හඳුනාගත නොහැකි විය.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

---------------------------------------

විෂය අංක 26701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.556,721ක ශේෂය ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අග්‍රිම ලබාගැනීමකින් තොරව එකතුව රු.4,999,477ක ණය ගෙවා තිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

-----------------------------------

### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් එය වර්ෂ තුනක් සඳහා පිළියෙල කර තිබූ අතර, 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වන ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය ආරම්භයේදි අනුමත කරගෙන නොතිබුණි.

### 3.7.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2014 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් එය පිළියෙල කර නොතිබුණි.

**3.7.3 අභ්‍යන්තර විගණනය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන ප්‍රධාන ගණකාධිකාරිවරයා, ප්‍රධාන අභ්‍යන්තර විගණක වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත්කර තිබුණි. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මුදල් රෙගුලාසි 134(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කළ යුතු වුවත්, එය 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.7.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබූ අතර එම කමිටු වාර්තා (Minutes) විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. 2006 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(l) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කමිටු රැස්වීම් සඳහා නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපතිවරයා වෙනුවෙන් ඔහුගේ නියෝජිතයෙකු සහභාගි විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී මේ සඳහා ආරාධනාවක් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.8 වත්කම් කළමනාකරණය**

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වත්කම් සමබන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

-------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වාදී තිබුණු අතිරික්ත, ඌණතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත්කළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ වූ ග්‍රාම නිලධාරි කාර්යාල 136ක ගබඩා භාණ්ඩ සමීක්ෂණයට භාජනය කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව රාජකාරි වාහන 16ක් ලියාපදිංචි කර ඇති බවට විගණනයට පැහැදිලි කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදි රාජකාරි වාහන 17ක් විසර්ජන ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) බේරුම් නොකළ බැරකම්

-------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවැත එන රු.220,890 ක බැරකම් පැවැතුණි.

## 3.9 අනුකුල නොවීම්

------------------------

**නිතී, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදි නිරික්ෂණය වු නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| | (i) මුදල් රෙගුලාසි 134(3) | - | සමාලෝචිත වර්ෂයේදි නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 135 | 214,033 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිවාඩු දින රාජකාරි කිරිම වෙනුවෙන් වූ ගෙවීම්, ඉන්ධන අත්තිකාරම්, ගමන් වියදම් සහ දුරකථන ගාස්තු දිස්ත්‍රික් ලේකම්වරයා අනුමත කිරීම වෙනුවට ඔවුන් විසින්ම අනුමත කරගෙන තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 137 | 87,481 | ගනුදෙනු දහයක් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අනුමත කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (iv) මුදල් රෙගුලාසි 138 | 5,578,923 | ගෙවීම් වවුචර් දහසයක් සහතික කර නොතිබුණි. |
| | (v) මුදල් රෙගුලාසි 137(2)(ඇ) | 50,000 | විධායක නොවන නිලධාරියෙකුට වීදි නාට්‍යයක භාණ්ඩ මිලදී ගැනීම් සඳහා රු.50,000ක අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| | (vi) මුදල් රෙගුලාසි 504 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හයක් විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ කාර්තුමය ප්‍රකාශවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>--------------------------- | | |
| | (i) 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂයේ දි දිස්ත්‍රික් ලේකම්වරයා විසින් නිවාඩු දින 40ක් රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වරයාගෙන් ලබාගත් පූර්ව අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන චක්‍රලේඛය | 6,066,220 | නිලධාරීන් 29 දෙනෙකුට වසර 2 ක ණය ගෙවා තිබූ අතර මේ සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟත්වය ලබාගෙන නොතිබුණි. |
| | | 1,626,060 | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින් 04 දෙනෙකුට වර්ෂ දෙකක ණය ලබාදී තිබුණු අතර මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ**<br>**----------------------** | | |
| | 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය සඳහා වන කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

## 3.10 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2009 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දි මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුට දුරකථන ගාස්තු ලෙස එකතුව රු.44,677 ක මුදලක් සීමාව ඉක්මවා ගෙවා තිබුණි.

## 3.11 පාඩු හා හානි

--------------

රාජකාරි වාහනයකට 2014 නොවැම්බර් 28 දින සිදු වූ රු. 227,926 ක පාඩුව සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුම්වලට ගෙන නොතිබූ අතර මුදල් රෙගුලාසි 104(2) ප්‍රකාරව මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ පාඩු පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන පරීක්ෂණවලින් ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2013 ජූලි සිට 2014 පෙබරවාරි දක්වා කාලය තුළ UNICEF ආධාර මත පන්ඩාරවන්නියන් ග්‍රාම සංවර්ධන සමිතිය සමග එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව ඉදිකරනු ලැබූ මහජන වැසිකිළි පද්ධතිය සම්බන්ධයෙන් එකතුව රු. මිලියන 2.71ක වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ වාර්තා කරන ලදි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පන්ඩාරවන්නියන් ග්‍රාමීය සංවර්ධන සමිතිය සමග එළඹ තිබූ ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරිමකින් තොරව රු. මිලියන 2ක් වන උපරිම සීමාවද ඉක්මවා වටිනාකම රු. 10,570,000ක වැඩ අදාල ග්‍රාමීය සංවර්ධන සමිතිය හරහා සිදු කරගෙන තිබුණි.

(ඇ) වැඩ අධීක්ෂණය, බැංකු ගිණුම් මෙහෙයවීම සුපරීක්ෂණ කටයුතු සහ වැඩවල ප්‍රගතිය පරීක්ෂාව සඳහා ප්‍රාදේශීය ලේකම්ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ග්‍රාම සංවර්ධන නිලධාරිට, දිස්ත්‍රික් ලේකම් විසින් වගකීම් පවරා තිබුණත් මේ පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර නොතිබූ බව විගණන නිරීක්ෂණවලදි අනාවරණය විය.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 17 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 209 | 197 | 12 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 30 | 44 | - | 14 |
| | එකතුව | 258 | 260 | 12 | 14 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 12 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) අතිරික්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 14 දෙනා සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.